# ශ්‍රී ලංකාවේ මැණික් පතල් කර්මාන්තය හා සැබැඳුණු ශිල්පීය ක්‍රම සහ එහි ඓතිහාසික වෙනස්වීම් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

තුෂාණි සංදීපනී මාටින්
රුහුණ විශ්වවිද්‍යාලය.
thushanimartin47@gmail.com

වසර ගණනක් මුළුල්ලේ දේශීය සංස්කෘතියේ පෝෂණය නිබඳව ලබමින් සබරගමුව පුරාම ව්‍යාප්තව පවතින්නා වූ මැණික් කර්මාන්තය පිළිබඳව ලංකාවට හිමිවනුයේ ලෝකයේ රටවල් අතරින් අද්විතීය ස්ථානයකි. ඉතා පැරණි කර්මාන්තයක් වන මැණික් කර්මාන්තය සඳහා දුරාතීතයක් ඇති බව ඓතිහාසික මූලාශ්‍රයවලින් පෙනීයයි. "රත්නදීප, සෙරන්ඩිබ් දිවයින" ආදී නම්වලින් ලංකාව හැඳින්වීමට හේතු වූයේ, ඈත අතීතයේ සිට ම ලංකාව මැණික් සඳහා ප්‍රසිද්ධියක් උසුලන නිසාවෙනි. ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික වෙනත් කර්මාන්ත හා සාපේක්ෂව සසඳා බැලීමේ දී මැණික් කර්මාන්තය ඇදහිලි විශ්වාස සමඟ දැඩිව බැඳී පවතී. ඊට හේතු වූයේ භූගත කැණීම්වල දී සම්පත් ලබාගැනීමේ අවිනිශ්චිතතාවයි. තව ද අතීතයේ භාවිත වූ පතල් ක්‍රම සේම තාක්ෂණය දියුණුවීමත් සමඟ යොදා ගනු ලබන ක්‍රම ද වර්තමානයේ ඒ සඳහා යොදා ගනු ලැබේ. මෙහි ලා පර්යේෂණ ගැටළුව වූයේ අනාදිමත් කාලයක සිට පැවතියා වූ මැණික් පතල් කර්මාන්තයේ විවිධ ශිල්පීය ක්‍රම හා එහි ඓතිහාසික වෙනස්වීම් මොනවා ද යන්න පිළිබඳව ය. ඒ සඳහා භාවිත කරන ලද පළමු ක්‍රමවේදය වූයේ ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ අන්තර්ගත වන පුස්තකාල සමීක්ෂණ ක්‍රමවේදය වේ. මෙම ක්‍රමවේදය යටතේ පොත්පත්, ලිපි ලේඛන මෙන් ම ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ තැන්පත්ව ඇති පෞරාණික හා කාලීන ලේඛන ද අධ්‍යයන කරනු ලැබීය. එසේම දෙවනුව ක්ෂේත්‍ර පර්යේෂණ ක්‍රමවේදය යටතේ තෙමාසික ක්ෂේත්‍ර පර්යේෂණයක් සබරගමු පළාතේ රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින් සිදුකරන ලදි. එහි දී තෝරාගත් ඉලක්කගත පුද්ගලයන් හා ඉලක්කගත කණ්ඩායම්ගේ සහභාගීත්වයෙන්, සහභාගීත්ව නිරීක්ෂණ ක්‍රමවේදය යටතේ කරුණු එක්තැන් කරන ලදි. එසේම අවුරුදු 2500කට වඩා ඉතිහාසයක් ඇති මැණික් පතල් කර්මාන්තයේ දී, සුලභ ලෙස මැණික් ලැබෙන ප්‍රදේශ ලෙස දිවයිනේ නිරිත දිගට විහිදී ගිය සැතපුම් පනහක් පමණ දිග, සැතපුම් පහළොවක් විස්සක් තරම් පලළ මැණික් තීරුව ලෙස හඳුන්වන රත්නපුරය නම් ප්‍රදේශය කැපී පෙනුනි. ඒ අනුව එම ප්‍රදේශයෙන් එකිනෙකට වෙනස් මැණික් පතල් වර්ග කිහිපයක් පිළිබඳව මූලිකවම හඳුනා ගැනීමට හැකියාව ලැබුණි. තව ද ඒවායේ පවතින ශිල්ප ක්‍රම ද එකිනෙකට වෙනස් වූ බව මෙම පර්යේෂණයේ දී සොයාගනු ලැබීම්. මෙම පර්යේෂණයේ දී ප්‍රධාන වශයෙන් පතල් වර්ග හතක් හඳුනා ගැනීමට හැකි විය. ඒ අනුව තට්ටු පතල් ක්‍රමය, ඇඳුම් පතල් ක්‍රමය, පතහ පතල් ක්‍රමය, කුණුපස් ගැරීමේ ක්‍රමය, ගොඩ පතල් ක්‍රමය, බැකෝ පතල් ක්‍රමය මෙන් ම සකර් ගැසීමේ ක්‍රමය ද මූලිකවම හඳුනාගත හැකි විය. ඒ අනුව සමස්තයක් වශයෙන් සැලකූ විට මැණික් පතල් කර්මාන්තයේ දුරාතීතයක සිට පැවතියා වූ මෙම ශිල්පීය ක්‍රම යම් යම් වෙනස්කම්වලට භාජනය වෙමින් වුව ද මේ දක්වා ම පවතින බව මින් ප්‍රත්‍යක්ෂ කොට දක්වාලිය හැකි ය.

**ප්‍රමුඛ පද :** ඇදහිලි විශ්වාස; තාක්ෂණික ක්‍රම; මැණික් පතල් කර්මාන්තය; ශිල්පීය ක්‍රම